**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -2 කොටස - 2019**

---

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 2 කොටස 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මේ වන විට ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර දක්වා) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කරමින් යෝජිත හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, වාණිජ අගනගරය, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සහ ජාත්‍යන්තර ගුවන්තොටුපල (මත්තල) අතර සම්බන්ධයක් ඇති කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ණය ගිවිසුමට ප්‍රකාරව, ව්‍යාපෘතියේ 02 වන කොටස යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගය බෙලිඅත්ත සිට වැටිය දක්වා කිලෝමීටර් 26 ක් දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 60,601.60 ක් වූ අතර, එයින් සියට 85 ක් වූ එ.ජ.ඩො. මිලියන 360.29 කට සමාන වූ රු. මිලියන 46,920 ක් සිවිල් හා උපදේශන කටයුතු සඳහා චීන අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. එ.ජ.ඩො. මිලියන 63.58 ක් වූ ඉතිරි සියයට 15 ක ප්‍රමාණය ශ්‍රී ලංකා හැටන් නැෂනල් බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ -02 කොටස යටතේ වූ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කර තිබුණු අතර 2019 ඔක්තෝබර් 27 දින වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින් ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේදී ගෙවීමට සිදුවූ ප්‍රමාද පොලිය සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව සිදු කර නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේදී ගෙවීමට සිදුව ඇති ප්‍රමාද පොළිය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | අධිවේගී මාර්ගය සාමාන්‍ය ජනතාවට විවෘත කරන අවස්ථාවේ ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අන්තර් හුවමාරුවක් පිහිටුවීමට ස්ථානයක් ලෙස හඳුනාගෙන නොතිබූ බැදිගම ප්‍රදේශයේ තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදිකිරීම සඳහා රු. මිලියන 100.83 ක මුදලක් වැය කර තිබුණි. | ව්‍යාපෘති පිරිවැය වැඩිවීමට ඇති හැකියාව. | එක්සිම් බැංකුවේ එකඟතාවයට යටත්ව කොන්ත්‍රාත් ඉතුරුම් යොදා ගනිමින් බැදිගම ප්‍රදේශයේ අන්තර් හුවමාරුවක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. | අනාගතයේ ව්‍යාපෘති සැලසුම් කිරීමේදී සියලු අවශ්‍යතා සලකා බැලිය යුතුය. |
| (ආ) | අධිවේගී මාර්ගය මහජනතාවට විවෘත කරන අවස්ථාව වනවිට පැති කාණු, දුර දක්වන පුවරු හා දිශාව දක්වන පුවරු, පිඩළි ඇතිරීම හා බෑවුම් සංරක්ෂණය සහ ආලෝකකරණය වැනි ප්‍රධාන ප්‍රමාණ පත්‍ර අයිතම හතරක් සියයට 95 කින් පමණ නිම කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ඉතිරි වැඩ නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදුවීමේ ඇති හැකියාව. | කොවිඩ් 19 වසංගත තත්ත්වය, ඇඳිරි නීතිය සහ ගමන් සීමා කිරීම් හේතුවෙන් පැති කාණු, තණකොළ ඇතිරීම හා බෑවුම් සංරක්ෂණය, දුර දැක්වෙන පුවරු හා දිශා පුවරු සහ ආලෝකකරණය අධිවේගී මාර්ගය විවෘත කරන අවස්ථාවේ නිම කිරීම ප්‍රමාද විය. | ඉතිරි වැඩ වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවලට අනුව ව්‍යාපෘති ඉංජිනේරුවරයා තෘප්තියට පත්වන පරිදි ඉතිරි වැඩ කොටස් (snags) 2737 ක් සහ අවසන් නොකළ සිවිල් වැඩ අයිතම 1887 ක් සම්පූර්ණ කිරීමට පෙර අත්පත් කර ගැනීමේ සහතිකය (Taking Over Certificate) නිකුත් කිරීම විගණනයේදී ප්‍රශ්නගත විය. | ඉතිරි වැඩ නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදුවීමේ හැකියාව. | වසංගත කාලපරිච්ඡේදයට පෙර 2020 පෙබරවාරි මාසයේදී කුඩා අයිතමවල ඉතිරි වැඩවල දිගු ලැයිස්තුවක් තිබියදී අත්පත් කර ගැනීමේ සහතිකය නිකුත් කිරීමට ඉංජිනේරුවරයා ගත් ක්‍රියාමාර්ග COVID 19 වසංගතයෙන් ගිවිසුම්ගත ප්‍රතිවිපාක වළක්වා ගැනීමට හේතු විය. | ඉතිරි වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති කළමනාකාරිත්වය විසින් 2020 සැප්තැම්බර් මස අවසන් වන විට පවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමේදී හඳුනාගෙන ඇති දෝෂ සහ ඉතිරි වැඩ අයිතම සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද, එම අයිතම බොහොමයක් සම්පූර්ණ කර නොතිබුණි. නියමිත වේලාවට කොන්ත්‍රාත්කරුගේ අඩුපාඩු සම්පූර්ණ කිරීමට සහ ඉතිරි වැඩ කටයුතු කරවා ගැනීමට සැලකිය යුතු අවධානයක් යොමු කර නොතිබුණු බව එයින් හැඟීයනු ඇත. | ඉතිරි වැඩ නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදුවීමේ හැකියාව. | කොවිඩ් 19 වසංගත බලපෑම මධ්‍යයේ වුවද දෝෂ දැනුම්දීමේ කාලසීමාව තුළ කොන්ත්‍රාත්කරු විසින් දෝෂ නිවැරදි කිරීම සහ ඉතිරි වැඩ කටයුතු සිදුකරණ ලදී. | ඉතිරි වැඩ සිදුකිරීම වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශක්‍යතා වාර්තාවේ සේවා ප්‍රදේශ දෙකක් සඳහන් කර ඇතත්, එය ඇස්තමේන්තු කර නොතිබුණු අතර සේවා ප්‍රදේශ ඉදිකිරීම සඳහා ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන සපයා නොතිබුණි. තවද, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී. 46 න් පසු අධිවේගී මාර්ග භාවිතා කරන්නන් සඳහා සේවා ප්‍රදේශ නොතිබුණි. | වැලිපැන්න සිට හම්බන්තොට දක්වා කි.මී. 176 ක දුරක් ගමන් කරන මගීන්ට සේවා සැපයීම ගැටලු සහගත තත්ත්වයකට පත් වීම. | සිවිල් වැඩ කොන්ත්‍රාත්තු මූලික අවධියේ පැවතියද, සේවා ප්‍රදේශ ඉදිකිරීමට දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර කිසිවක ප්‍රතිපාදන සපයා නැත. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති සඳහා සේවා ප්‍රදේශ ඉදිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැළසිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ප්‍රමාණ පත්‍රවල සඳහන් අගය වන රු.මි. **225** ක් ඉක්මවා **2019** දෙසැම්බර් දක්වා කාර්ය සාධන බැදුම්කර පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු.මි. **347** ක මුදලක් කොන්ත්‍රාත්කරුට අතිරේකව ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට අනිසි වාසි අත්වීම. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා පසුව කාලය දීර්ඝ කිරීම හේතුවෙන් කාර්ය සාධන බැදුම්කර සැපයීමේ තත්‍ය පිරිවැය වැඩි වී තිබුණි. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥයා සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත්තුව අවසානයේ අපනයනය කළ යුතු එ.ජ. ඩොලර් **10,363,385** ක් වටිනා භාණ්ඩ ප්‍රති අපනයනය කිරීමෙන් හෝ බඳු ගෙවීමෙන් වැළකී සිටීමෙන් කොන්ත්‍රාත්කරු විසින් අසාමාන්‍ය වාසි ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුවන්ට අනිසි වාසි අත්වීම. | ද.අ.මා.දි. ව්‍යාපෘතිය-2 අදියර නිමවනතුරු ද.අ.මා.දි. ව්‍යාපෘතිය-3 අදියර සඳහා ආනයනය කරන ලද උපකරණ සහ යන්ත්‍ර භාවිතයට ගැනීමෙන් ද.අ.මා.දි. ව්‍යාපෘතිය-2 අදියරේ අහිමි වූ ප්‍රගතිය කොන්ත්‍රාත්කරුට ලබා ගැනීමට හැකි වනු ඇත. | ව්‍යාපෘතිය අවසානයේ ප්‍රති අපනයනය කිරීමට හෝ බඳු ගෙවීමට කටයුතු කළ යුතුය. |